# නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ ව්‍යවස්ථාව
# (2011 මැයි 24 මහා සභා සංශෝධන සහිතව)

**(1) නම ඃ**

සංවිධානයේ නම- නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙයි.

**(2) අරමුණු ඃ**

(i) ශ්‍රී ලංකාව තුළ නිදහස් සහ ස්වාධීන මාධ්‍යයන්හි ක්‍රියාත්මක වීම සියලු ආකාරවලින්, දිරි ගැන්වීම, පෝෂණය කිරීම සහ සහයෝගය දැක්වීම.

(ii)විදේශ ජනමාධ්‍ය සේවා ජනමාධ්‍යවේදීන් [Foreign correspondents] ඇතුළු ශ්‍රී ලංකාවේ වැඩ කරන සියලු ජනමාධ්‍යවේදීන්ට සිය කර්තව්‍යය නිදහසේ කරගෙන යාම සඳහා අවශ්‍ය තත්ත්වයන් දිරිගැන්වීම, පෝෂණය කිරීම සහ ආරක්ෂා කිරීම.

(iii) ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන ජනමාධ්‍යවල ක්‍රියාකාරිත්වයට බාධා කරන සියලු අවහිරයන් ප්‍රජාතන්ත්‍රවාදී අන්දමින් ඉවත් කිරීමට ක්‍රියාකිරීම.

(iv) ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන ජනමාධ්‍ය සඳහා අවශ්‍ය වන නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම සඳහා මහජන මත ඇති කිරීමේ ව්‍යාපාර (campaign) පවත්වාගෙන යාම.

(v) ශ්‍රී ලංකාවේ නව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයන් ස්ථාපිත කිරීම සඳහා අනුබල දීම සඳහා සහ පවත්නා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් හා පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන සියලු ක්‍රියාකාරකම් සිදු කිරීම.

(vi) ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සහ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වය තහවුරු කෙරෙන නිසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආරක්ෂණයක් සඳහා මහජන මත ඇති කිරීමේ ව්‍යාපාර (campaign) දියත් කිරීම.

(vii) පුළුල් ප්‍රජාතන්ත්‍රවාදය, භාෂණයේ නිදහස ඇති කිරීම සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන නව වගන්ති ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කිරීම සඳහා මහජන මත ඇති කිරීමේ ව්‍යාපාර (campaign)සංවිධානය කිරීම සහ ඒ සඳහා මහජන මතයක් නිර්මාණය කිරීම මෙන්ම, එමගින් ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට දායක වීම.

(viii) ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තිමය නිදහස ශක්තිමත් කිරීම උදෙසා, ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් ඉහළ නංවනු වස් තනිව සහ සමාන අරමුණු සහිත වෙනත් සංවිධාන සමඟ එක්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ix)ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීයමය අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම, සහ ඔවුන්ගේ ආර්ථික තත්වයන් වැඩිදියුණු කිරීම යනාදිය උදෙසා විවිධ සංවිධානවල සේවය කරන ජනමාධ්‍යවේදීන්ට එකිනෙකා සමග සබඳතා ඇති කරගැනීමට සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහාය වන කටයුතුවල යෙදීම.

(x)ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට අවශ්‍යවන ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ සහ ජනමාධ්‍යවේදීන්ගේ හා අනෙකුත් සේවකයින්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින්, තමා සේවය කරන ආයතනවල වෙනත් සේවාවන් ඉටු කරන සේවකයන් සහ ජනසන්නිවේදන කටයුතුවල යෙදෙන අනෙකුත් සංවිධානවල සේවකයින් සමඟ සම්බන්ධතා ඇති කරගැනීමට ජනමාධ්‍යවේදීන් දිරි ගැන්වීම සඳහා කටයුතු කිරීම.

(xi) ජනමාධ්‍යවේදීන්ට, ජනමාධ්‍යවේදයට සහ ජනසන්නිවේදනයට බලපාන සහ ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට අවහිර කරන වෘත්තිමය, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික කරුණු ගැන සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සැපයීම.

(xii) ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට ඉවහල් වන මහජන මතයට, දේශපාලන පක්ෂවලට සහ සංවිධානවලට බලපෑම් කිරීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, අධ්‍යයන කණ්ඩායම් වැඩමුළු, මහජන රැස්වීම්, ප්‍රදර්ශන පැවැත්වීම, ග්‍රන්ථ, පත්‍රිකා, රූපමය සටහන් ආදිය පළ කිරීම, තැටිගත කිරීම් සකස් කිරීම හා බෙදා හැරීම ආදී වූ ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අත්‍යවශ්‍ය අංගයන් වන ප්‍රකාශනයේ නිදහස හා තොරතුරු දැන ගැනීමේ අයිතිය කෙරෙහි බලපාන හා ඒවා සීමා කරන කරුණු පිළිබඳව පුළුල් මහජන සාකච්ඡාවක් සඳහා දිරි ගැන්වීම.

(xiii)ශ්‍රී ලංකාවේ නිදහස් සහ ස්වාධීන මාධ්‍යවල ක්‍රියාකාරීත්වයට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට ද තර්ජනයක් වන ජාතිවාදය, කුලවාදය, ලිංග භේදය මත පහත් කොට සැලකීම (sexism), ආගම්වාදය සහ අන් මත නොඉවසීම (intolerance) මෙන්ම දේශපාලනමය හා දෘෂ්ටිවාදමය අන් මත නොඉවසීම පැතිරවීම උදෙසා ජනමාධ්‍යවේදය හා ජන සන්නිවේදන මාධ්‍ය භාවිතා කිරීම අධෛර්යමත් කිරීම සහ ඊට එරෙහිව මහජන මත ඇති කිරීමේ ව්‍යාපාර (campaign)සංවිධානය කිරීම.

(xiv) සිය වෘත්තිමය ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා මෙන්ම ශ්‍රී ලංකාවේ මාධ්‍ය ප්‍රමිතීන් ඉහල නැංවීම සඳහා, ජනමාධ්‍යවේදීන්ට පුහුණු පහසුකම් සැලසීම සඳහා සහාය වීම.

(xv) අනෙකුත් රටවල ජනමාධ්‍යවේදීන්ගේ අයිතිවාසිකම් හා නිදහස් සහ ස්වාධීන මාධ්‍ය සම්බන්ධ කරුණු පිළිබඳව උනන්දු වීම සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ අරමුණුවලට සමානව වැඩ කරන විදේශීය සංවිධාන හා සම්බන්ධතා ඇති කර ගැනීම.

**3,අර්ථකථනය ඃ**

මාධ්‍යවේදියා යනුවෙන් මෙම ව්‍යවස්ථාව මගින් පිළිගනු ලබන්නේ තොරතුරු එක්රැස් කරන වාර්තාකරණයේ යෙදෙන පුවත්පත් සඟරා සහ වාර ප්‍රකාශන ගුවන්විදුලි රූපවාහිනි මුද්‍රිත මාධ්‍ය සහ විද්‍යුත් ඡායා උත්පාදන (Facsimile Transmission) වෙනුවෙන් ප්‍රවෘත්ති විශේෂාංග

ලියන හෝ සංස්කරණය කරන සියල්ලන් වන අතර ඡායාරූප ශිල්පීන් ගුවන් විදුලි නිවේදකයන් රූපවාහිනී නිවේදකයන් වැඩසටහන් නිර්මාණකරුවන් සියලු විදේශ වාර්තාකරුවන්,තීරුලිපි රචකයින්, ප්‍රාදේශීය වාර්තාකරුවන් සහ නිදහස් වාර්තාකරුවන් යන සියල්ලන් ද ඊට ඇතුලත්ය.

**4.සාමාජිකත්වය ඃ**

සංවිධානයේ සාමාජිකත්වය එහි අරමුණු පිළිගන්නා සහ ව්‍යවස්ථාවෙහි අඩංගු සාමාජිකත්වය සඳහා වන කොන්දේසි පිළිගන්නා මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය සංවිධානවලට ලබා ගත හැකි අතර සාමාජිකත්වය පහත සඳහන් වර්ගවලට අයත් වුවද විශේෂයෙන් දක්වා නොමැති අවස්ථාවලදී හැර අන් සියලු අවස්ථාවලදී සියලු සාමාජිකයන් එකම කොට්ඨාශයක් ලෙස සැළකේ.

i) වර්ග-ජ්‍යෙෂ්ඨ සාමාජික, සාමාජික සහ සම්බන්ධක සාමාජික යනුවෙන් සාමාජික වර්ග තුනකි.

ii)ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්

අවම වශයෙන් වසර හතක් අඛණ්ඩව සංවිධානයේ සාමාජිකත්වය දරූ සාමාජිකයන්

iii) ආරාධිත සාමාජිකයින්

ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහ සෙසු සාමාජිකයන් විසින් සංවිධානයෙහි සාමාජිකත්වය ලබා ගැනුම සඳහා ආරාධනා කරනු ලැබූ හා එම ආරාධනය පිළිගනු ලැබූ පුද්ගලයන් ආරාධිත සාමාජිකයන් වනු ඇත.

iv) සම්බන්ධක සාමාජිකයන්-

නිදහස් මාධ්‍ය ව්‍යාපාරයෙහි අරමුණු හා සැසඳෙන්නේ යැයි ක්‍රියාකාරී කමිටුව විසින් පිළිගනු ලබන සංවිධානයන්හි පුද්ගලයන්ට සාමාජිකත්වය ලබා ගැනුමට ක්‍රියාකාරි කමිටුවෙහි ඒකමතික තීන්දුවක් මත ආරාධනා කළ හැකි අතර එකී පුද්ගලයන් සම්බන්ධක සාමාජිකයන් වනු ඇත.

**5)සාමාජික අයිතීන් -**

i) සාමාජිකයන්ට සංවිධානයෙහි ඕනෑම තනතුරක් සඳහා තරග කළ හැකි අතර වාර්ෂික හා විශේෂ සම්මේලනයන් හිදී ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට යටත්ව ඡන්දය පාවිච්චි කළ හැකි අතර, ක්‍රියාකාරි කමිටුවෙහිත් ක්‍රියාකාරි කමිටුව හෝ පොදු සාමාජිකත්වය විසින් පත්කරනු ලබන අනු කමිටු වලද සේවය කළ හැකි සේම ඒවායේ ඡන්දයද පාවිච්චි කළ හැක.

ii) සම්බන්ධක සාමාජිකයින්ට සංවිධානයෙහි කිසිදු තනතුරක් දැරිය නොහැකි අතර වාර්ෂික හෝ විශේෂ සම්මේලනයන් හි ඡන්දය පාවිච්චි කිරීමටද අයිතියක් නැත. එසේ නමුත් ඔවුන්ට නිරීක්ෂකයින් ලෙස එවැනි රැස්වීම් සඳහා සහභාගි විය හැක.

**6)භාරකාරත්වය ඃ**

i) භාරකාරත්ව මණ්ඩලය ඃ සංවිධානයෙහි භාරකාරත්ව මණ්ඩලයක් වන්නේය. සංවිධානයේ සියලු නිශ්චල සහ චංචල දේපොලත් අරමුදලුත් ඔවුන්ගේ භාරකාරත්වය යටතේ පවතී. අරමුදල් පරිපාලනය පිළිබද ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේ සහ විධිවිධාන නියම කිරීමේ ඒකකය ලෙසද එය ක්‍රියාත්මක වේ. භාරකාර මණ්ඩලයට සංවිධානය වෙනුවෙන් නඩු පැවරීමේ අයිතිය ඇත්තා සේම සංවිධානයට එරෙහිව නඩු පවරනු ලබන විට ද එකී භාරකාරත්ව මණ්ඩලය එම වගකීම දරන්නේය. එලෙසින්ම සංවිධානයෙහි කළමණාකාරිත්වය සම්බන්ධව භාරකාරත්ව මණ්ඩලයට අවශ්‍ය යැයි හැගෙන ඕනෑම විටෙක ක්‍රියාකාරි කමිටුවට උපදෙස් ලබා දිය හැක.

ii)සංයුතියඃ  භාරකාරත්ව මණ්ඩලය සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. ඉන් එක් කෙනෙකු ලෙස නිල බලයෙන් කැඳවුම්කරු පත්වේ. ක්‍රියාකාරි කමිටු සාමාජිකයින් නොවන ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් දෙදෙනෙකු අනෙක් භාරකාරත්ව මණ්ඩල සාමාජිකයින් ලෙස පත්වේ. මෙම සාමාජිකයින් දෙදෙන වාර්ෂික සම්මේලනයෙන් පත් කරනු ලබන අතර ඉන් එක් අයෙකු වසර දෙකක් සඳහාත් අනෙකා එක් වසරක් සඳහා පමණක් පත් කරනු ලබයි ඔවුන් ගේ නිල කාලය අවසන් වූ පසු ඔවුන් නැවත පත් කළ හැක.

iii)රැස්වීම ඃ සංවිධානයෙහි ක්‍රියාකාරිත්වයත් මූල්‍ය තත්ත්වයත් විමසීමටත් අවශ්‍ය උවදෙස් ක්‍රියාකාරී කමිටුවට ලබාදීමටත් භාරකාරත්ව මණ්ඩලය අවම වශයෙන් තෙමසකට වරක් හෝ රැස්විය යුතුය.

iv)ලේකම් සහ භාණ්ඩාගාරික ඃ භාරකාරත්ව මණ්ඩලයෙහි ලේකම් ලෙස සංවිධානයෙහි ලේකම් නිල බලයෙන් කටයුතු කරනු ඇති අතර මුදල් තත්ත්වය සම්බන්ධයෙන් තොරතුරු වාර්තා කිරීම සඳහා භාණ්ඩාගාරිකද සහභාගි විය යුතුය.

v)ආයෝජන ඃ සංවිධානයෙහි අරමුදල් සහ වත්කම් භාරකාරත්ව මණ්ඩලයේ ලිඛිත අවසරයකින් තොරව ආයෝජනය කිරීමට හෝ වෙනත් ආකාරයකින් යෙදවීමට හෝ නොහැක.

vi) සංවිධානයේ මුදල් කලමනාකරණය අධීක්ෂණය සඳහා සංවිධානයේ අරමුණු හා එකග වන පිටස්තර පිළිගත් පුද්ගලයන් තිදෙනෙකුගෙන් සමන්විත මූල්‍ය අධීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සංවිධානයේ මහා සභාව විසින් කළ යුතුය.

**7)විධායක කමිටුව සහ නිලධරයන් ඃ**

i)සංවිධානයෙහි එදිනෙදා කටයුතු කළමණාකරණය සඳහා ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සහ ආරාධිත සාමාජිකයින් අතරින් විධායක කමිටුවක් පත් කරනු ලබයි.

ii)සංයුතිය ඃ පහත සඳහන් නිල තනතුරුවලින් විධායක කමිටුව සමන්විත වන්නේය.
කැඳවුම්කරු
ලේකම්

භාණ්ඩාගාරික
උපලේකම්
වාර්ෂික සම්මේලනයෙන් තෝරාගනු ලබන කමිටු සාමාජිකයින් නව දෙනෙකු(9)

iii) රැස්වීම් ඃ ක්‍රියාකාරී කමිටුව අවම වශයෙන් මසකට වරක් හෝ රැස්විය යුතුය. එසේ නැතිනම් ඊට ආසන්න දින හතකට (07) නොවැඩි දින ගණනක් ඇතුලත පැවැත්විය යුතුය.

iv)අනුකමිටු ඃ ක්‍රියාකාරී කමිටුව අවශ්‍ය යැයි තීරණය කරන ඕනෑම කාරණයක් සම්බන්ධව ක්‍රියාකාරී සාමාජිකයන්ගෙන් අනුකමිටු පත්කළ හැක. එවැනි අනුකමිටුවල ලේකම් වශයෙන් සහකාර ලේකම් හෝ ලේකම් ක්‍රියාකරනු ඇත.

v)අනුයුක්ත කිරීම් ඃ කිසියම් අවශ්‍යතාවයක් වෙතොත් ඒ වෙනුවෙන් ක්‍රියාකාරී කමිටුවට පොදු සාමාජිකත්වයෙන් සාමාජිකයින් අනුයුක්ත කරගත හැක. එසේ වූවත් එවැනි අනුයුක්ත කෙරුණු සාමාජිකයින් හට සංවිධානයේ කිසිඳු නිල තනතුරක් දැරිය නොහැක.

vi)පුරප්පාඩු ඃ ක්‍රියාකාරී කමිටුවෙහි පුරප්පාඩුවක් ඇතිවුවහොත් එහි සාමාජිකත්වයට වෙනත් සාමාජිකයෙකු යෝජනා කිරීමෙන් එම පුරප්පාඩුව පිරවිය හැක. එනමුත් එය වලංගුවන්නේ එතැන් සිට එළැඹෙන ඊළඟ වාර්ෂික හෝ විශේෂ සම්මේලනය දක්වා පමණි.

vii)බහු තනතුරු දැරීම ඃ කිසිදු නිල දරන්නෙකුට සංවිධානයෙහි තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක් දැරිය නොහැක.

viii)නැවත තේරි පත්වීම ඃ ක්‍රියාකාරී කමිටුවෙහි සියල්ලන් ඊලග වාර්ෂික සමුළුව තෙක් පමණක් තෝරා පත් කරනු ලබයි. ඔවුන්ට නැවත තේරීපත්වීමේ අයිතිය ඇත්තාහ. එනමුත් වාර්ෂික සම්මේලන දෙකකින් අඛන්ඩ වසර දෙකක් එකම තනතුරක් සඳහා තේරිපත් විය නොහැක.

ix)තීරණ ඃ ක්‍රියාකාරී කමිටුවේ තීරණ ගනු ලබන්නේ වැඩි ඡන්දයෙනි. සමාන බෙදීමක දී කැඳවුම්කරුට හෝ මූලාසනය දරණ සාමාජිකයාට ඡන්ද දෙකක් භාවිතා කළ හැක.

x) ගණපුරණය ඃ ක්‍රියාකාරී කමිටුවෙහි ඝණ පූරණය සාමාජිකයින්ගෙන් පස් (05) දෙනෙකි.

xi)නොපැමිණීම ඃ ක්‍රියාකාරී සාමාජිකයෙකු / සාමාජිකාවක් අඛණ්ඩව තෙවසරක් කමිටු රැස්වීම් සඳහා පූර්ව දැනුම්දීමකින් නිදහස් නොකරගෙන නොපැමිණියහොත් ඔහුගේ හෝ ඇයගේ ක්‍රියාකාරී කමිටු සාමාජිකත්වය අහෝසි වන අතර ඒ බැව් ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

**8) නිලධර වගකීම ඃ**

i)කැඳවුම්කරු ඃ ක්‍රියාකාරි කමිටු රැස්වීම් කැඳවීමත් ක්‍රියාකාරී සහ පොදු රැස්වීම් හි මූලාසනය දැරීමත් කැඳවුම්කරුගේ වගකීම වන අතර ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් ගෙන් උපදෙස් ලබාගැනීමෙන්(consultation) සංවිධානය වෙනුවෙන් නිවේදන නිකුත් කිරීම ද කැඳවුම්කරුගේ වගකීමය.

ii)ලේකම් ඃ

අ) කැඳවුම්කරු නොමැත්තේ නම් හෝ නොහැකියාවක් වේ නම් ලේකම් විසින් ක්‍රියාකාරී කමිටු කැඳවිය යුත්තේය ඒ සමගම මෙම ව්‍යවස්ථාවට අනුකූලව සංවිධානයේ පොදු රැස්වීම් කැඳවිය යුතුය.

ආ)ලේකම් විසින් සංවිධානයේ පොදු රැස්වීම්වල හා ක්‍රියාකාරී කමිටු රැස්වීම්වල සත්‍ය වාර්තා තබා ගත යුතු අතර සංවිධානයේ සියලු ලිඛිත ගණුදෙනු නිවැරදිව ගොනුකර තබාගත යුතුය

ඇ) කැදවුම්කරු නොමැති විටෙක අනෙක් ක්‍රියාකාරි සාමාජිකයන්ගේ එකගත්වය ඇතිව සංවිධානය වෙනුවෙන් ලේකම් නිවේදන නිකුත් කළ යුතුය

iii)උපලේකම් ඃ උපලේකම් විසින් ලේකම්ගේ සියලු කාර්යන් සඳහා සහාය විය යුතු අතර ලේකම් නොමැති විට ක්‍රියාකාරී කමිටු සාමාජිකයින්ගේ එකඟත්වය ඇතිව ලේකම් තනතුරෙහි වගකීම ඉටු කළ යුතුය.

iv)භාණ්ඩාගාරික ඃ

අ)භාණඩාගාරික විසින් සංවිධානයේ සියලු මුදල් පිළිබද වගකීම දැරිය යුතු අතර ගිණුම් වාර්තාද තැබිය යුතුය. සියලු ආකාරයේ ගිණුම් පොත් තැබීම සහ නඩත්තුවත් සංවිධානයේ කටයුතු සඳහා මුදල් ලබා දීමත් ඊට ඇතුලත්ය. සංවිධානයේ අනාගත කාර්යයන් සටහන් කිරීමත් අනාගත අයවැය සකස් කිරීමත් සංවිධානයට අරමුදල් එකතු කිරීම සඳහා යෝජනා සැකසීමත් භාණ්ඩාගාරික සතු වගකීමක් වේ.

ආ) තනතුරට පත්වීමෙන් පසු එළැඹෙන වාර්ෂික සම්මේලනය සඳහා නිසි විගණනයකින් පසු සංවිධානයේ අය වැය වාර්තාව ඉදිරිපත් කිරීම භාණ්ඩාගාරික සතු වගකීමකි.

ඇ)සංවිධානයේ මාසික ගිණුම් වාර්තාවක් භාණ්ඩාගාරික විසින් ක්‍රියාකාරී කමිටු මාසික රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

v) සංවිධානයේ කිසිම නිලධාරියෙකුට සංවිධානයේ කටයුතු සඳහා පෙනී සිටීම හෝ ක්‍රියා කිරීම වෙනුවෙන් වැටුප් හෝ දීමනා ලබා ගත නොහැක.

**9) විශේෂ සම්මේලන**

i)ශ්‍රී ලංකාවේ නිදහස් හා ස්වාධීන මාධ්‍යයක් පවත්වා ගැනීම වෙනුවෙන් වැදගත් හා හදිසි කාරණා සාකච්ඡා කිරීමට ක්‍රියාකාරී කමිටුවේ තීරණයක් මත හෝ භාරකාරත්ව මණ්ඩලයේ ඉල්ලීමක් මත විශේෂ සම්මේලනයක් කෙටි දැනුම්දීමකින් කැඳවීමට කැඳවුම්කරුට හෝ ලේකම්ට අවසර ඇත.

ii)මෙම ව්‍යවස්ථාවේ සඳහන් අරමුණුවලට පටහැනි නොවේ යැයි ක්‍රියාකාරී කමිටුවට හැගේ නම් ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් 10 දෙනෙකු ඇතුලත් සාමාජිකයින් 15 දෙනෙකුට නොඅඩු සාමාජික පිරිසකගේ අත්සනින් ඉදිරිපත් කෙරෙන ලිඛිත යෝජනාවක් අනුව කැඳවුම්කරුට හෝ ලේකම්ට විශේෂ සම්මේලනයක් කැඳවිය හැක.

iii) එවැනි විශේෂ සම්මේලනයක් සඳහා දින 14 ක දැනුම් දීමක් ලබාදිය යුතුය.

iv) විශේෂ සම්මේලන වල තීරණ ගත යුත්තේ විවෘත සභාවෙනි.අත් එසවීමෙනි.සමාන බෙදීමකදී කැඳවුම්කරුට හෝ මූලාසනයේ ඉන්නා පුද්ගලයාට අමතර ඡන්දයක් භාවිතා කළ හැකිය.

v) විශේෂ සම්මේලනයක න්‍යාය පත්‍රය වනුයේ විශේෂ සම්මේලනය කැදවීමේ ලිපිය කියවීම ඊට ඉහතින් පැවති විශේෂ සම්මේලනයේ වාර්තාව කියවීම. නොපැමිණීම හෝ වෙනත් එවැනි නිදහසට කරුණු ලැබී ඇත්නම් ඉදිරිපත් කිරීම.විශේෂ සම්මේලනය කැදවනු ලැබූ කාරණාව/කරුණු හෝ යෝජනාව / යෝජනා සාකච්ඡාවට ගැනීම. න්‍යාය පත්‍රයට පිටතින් කිසිදු කාරණාවක් විශේෂ සම්මේලනයේදී සාකච්ඡාවට නොගත යුතුය.

**10) වාර්ෂික සම්මේලනය ඃ**

i)සෑම වර්ෂයකම මැයි මස 31 වන දිනට පෙර හා මැයි මාසයේ අවසන් සති දෙක ඇතුලත වාර්ෂික සම්මේලනය පැවැත්විය යුතුය.

ii)දැන්වීම ඃ වාර්ෂික සම්මේලනයේදී ඉදිරිපත් කළ හැකි යෝජනා ඉදිරිපත් කිරීමටත් නිල තනතුරු සදහා නාම යෝජනා ඉදිරිපත් කිරීමටත්, භාරකාරත්ව මණ්ඩලයට සාමාජිකයින් නම් කිරීමටත්, වාර්ෂික සම්මේලනය සඳහා යෝජිත දිනයට දින 28 ක් අවම වශයෙන් කල් ඇතිව ලේකම් විසින් සාමාජිකත්වයට දැනුම් දීමක් කළ යුතුය.

iii)න්‍යාය පත්‍රය දැනුම්දීම ඃ වාර්ෂික සම්මේලනයට දින 14 කට පෙර එය පැවැත්වෙන දිනය හා ස්ථානය න්‍යාය පත්‍රය නිල තනතුරු සඳහා ඉදිරිපත්ව ඇති නාම යෝජනා සහ සංවිධානයේ අරමුණුවලට පටහැනි නොවන සම්මේලනයේදී සාකච්ඡාවට ගත යුතු යෝජනා ලේකම් විසින් සියලු සාමාජිකත්වය ලිඛිතව දැනුම් දිය යුතුය.

iv)නාම යෝජනා ඃ

අ) ක්‍රියාකාරී කමිටුවට හෝ භරකාරත්ව මණ්ඩලයට ඉදිරිපත් වන සෑම පුද්ගලයෙකුගේම නාම යෝජනා සාමාජිකයෙකු විසින් යෝජනා කර තවත් සාමාජිකයෙකු විසින් නිල වශයෙන් ස්ථිර කර තිබිය යුතුය.

ආ) නාම යෝජනා ඉදිරිපත් කරන විට වාර්ෂික සාමාජික මුදල නොගෙවා හිඟ පවතින සාමාජිකයන්ට නිල තනතුරු සඳහා තරග කිරීමට නාම යෝජනා ඉදිරිපත් කිරීමට හෝ ස්ථිර කිරීමට නොහැක.

ඇ) කල්තබා නාම යෝජනා නොලැබ නිල සඳහා පුරප්පාඩු ඇති අවස්ථාවන්හි මිස වාර්ෂික සම්මේලනයේදි නාම යෝජනා ඉදිරිපත් කළ නොහැක

v)නිලවරණ ඃ
එක් නිල තනතුරකට එක නාම යෝජනාවකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති විටෙක අත් එසවීමෙන් වැඩි ඡන්දය ලබන පුද්ගලයා එකී නිලයට තෝරා පත් වු පුද්ගලයා ලෙස නම් කරනු ලබයි. සමාන ඡන්ද ඇති විටෙක මූලාසනයට එක් වැඩිපුර ඡන්දයක් භාවිතා කළ හැකිය.

vi)මූලාසනය ඃ
අ ) කැඳවුම්කරු හෝ ඔහු/ඇයගේ නොපැමිණීම හේතුවෙන් ඉවත්ව යා යුතු ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයෙකු සම්මේලනයේ පළමු සැසිවාරයේ මුලසුන දැරිය යුතු අතර නිලවරණය සඳහා එකී මුලාසනයට අන්තර් වාර මූලාසනයක් පත් කර ගත යුතුය.

ආ) අන්තර් වාර මුලසුන දරන්නා ඉවත්වන ක්‍රියාකාරී කමිටුවෙහි හා ඊලග ක්‍රියාකාරී කමිටුවට තරග වදින්නෙකු නොවිය යුතුය.

vii)න්‍යාය පත්‍රය ඃ වාර්ෂික සම්මේලනයේ න්‍යාය පත්‍රය වනුයේ ,

සම්මේලනය කැඳවීමේ ලිපිය කියවීම.ඊට ඉහතින් පැවැති වාර්ෂික හා විශේෂ සම්මේලන වාර්තා කියවීම.
වාර්තාවලින් පැන නගින ප්‍රශ්න. නොපැමිණීම් හෝ වෙනත් එවැනි නිදහසට කරුණු ලැබී ඇත්නම් ඉදිරිපත් කිරීම.
පසුගිය වර්ෂය සඳහා වන ලේකම් වාර්තාව ඉදිරිපත් කර සභා සම්මත කිරීම.
භාණ්ඩාගාරිකගේ ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරිම සහ එය සභා සම්මත කිරීම.
ක්‍රියාකාරී කමිටුව විසින් පිළිගනු ලැබ ඇති හා දැනුම් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීම.
නිල තනතුරු සහ භාරකාරත්ව මණ්ඩලයට නිලධරයින් තෝරා පත් කර ගැනීම.
ගරු විගණනකවරු තෝරාපත් කර ගැනීම.
කැඳවුම්කරු විසින් සම්මේලනයේ කටයුතු අවසන් කිරීම.
න්‍යාය පත්‍රයට පිටතින් කිසිදු කරුණක් සාකච්ඡාවට නොගත යුතුය.

viii) ගණ පූරණය ඃ වාර්ෂික හෝ විශේෂ සම්මේලනයක ගණ පූරණය සාමාන්‍යයෙන් විස්සකට (20) අඩු නොවිය යුතුය. එහෙත් එවැනි සම්මේලනයක න්‍යාය පත්‍රයෙහි ව්‍යවස්ථා සංශෝධනයකට යෝජනා අඩංගු වන්නේ නම් එදිනට ඡන්දය භාවිතා කිරීමට අයිතිය ඇති සංවිධානයේ මුලු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටිය යුතුය.

ix) ගණ පූරණයක් නොමැති විම ඃ ගණ පූරණයක් නොමැත්තේ නම් සම්මේලනය කල් තබා දින 10 කට නොවැඩි කාලයක් ඇතුලත නැවත කැඳවීමක් කර එදිනට සහභාගී වන සාමාජිකත්වය විසින් ගණ පූරණය නොතකා අදාල න්‍යාය පත්‍රයට අනුව කටයුතු කළ යුතුය. එහෙත් එවැනි අවස්ථාවක ගණ පූරණයක් නොමැත්තේ නම් ව්‍යවස්ථා සංශෝධන සාකච්ඡාවට ගත නොහැක.

පළමු වාර්ෂික සම්මේලනය 1994 මැයි මස පැවැත්විය යුතුය.

## 11) ව්‍යවස්ථා සංශෝධන

i)යෝජනා ඃ මෙම ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ආ හැක්කේ ලේකම් වෙත කෙරෙන පූර්ව ලිඛිත දැනුම් දීමකින් පසු අවම සාමාජිකයින් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කෙරෙන විශේෂ යෝජනා(වක්) ලෙසින්ය. එම විශේෂ යෝජනා(ව) ඒ වෙනුවෙන් කැදවෙන විශේෂ සම්මේලනයක දී හෝ අවකාශයන්ට යටත්ව සහ පහතින් සඳහන් ව්‍යතිරේඛයන්ට යටත්ව සාකච්ඡාවට ගත හැක.

ii)ව්‍යතිරේඛ ඃ
අ) විශේෂ යෝජනාවක් ඉදිරිපත් කිරීමට එය සංවිධානයෙහි අරමුණුවලට පටහැනි නොවන්නේ යැයි ක්‍රියාකාරි කමිටුව විසින් අනුමත කළ යුතුය යන කොන්දේසිය එම යෝජනාව සංවිධානයේ ව්‍යවස්ථානුගත අරමුණු සංශෝධනය කිරීමට වෙනස් කිරීමට හෝ ඊට එකතුවක් කිරීමට නොවන්නේ නම් හෝ සංවිධානයේ සාමාජිකත්වය සඳහා වන නෛතික තත්වයන්ට එකතුවක් නොවන්නේ නම් අදාල නොවන්නේය.

ආ) පළමු සම්මේලනය පැවැත්වූ දිනයෙන් වසර 06 ක් ඉක්ම ගිය පසු ව්‍යවස්ථාවෙහි 04 වන වගන්තියෙහි i/ii/iii සහ iv වන උප වගන්තිවල සඳහන් සාමාජිකත්වය සම්බන්ධ නෛතික අවකාශයන් වාර්ෂික හෝ විශේෂ සම්මේලනයක සාකච්ඡාවට ගැනීමේ අවසරය ඇත.

iii)පිළිගැනීම ඃ ව්‍යවස්ථා සංශෝධනය සඳහා සභාගත කරනු ලබන යෝජනාවක් සම්මත කළ හැක්කේ එම වාර්ෂික හෝ විශේෂ සම්මේලනයට සහභාගි වන ඡන්දය පාවිච්චි කිරීමට අයිතිය ඇති මුළු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකක ඡන්දය මතය.

**12 මූල්‍ය පාලනය ඃ**

i)බැංකු ඃ ක්‍රියාකාරී කමිටුව විසින් යෝජනා සම්මතයෙන් අනුමත කරනු ලැබූ බැංකුවක හෝ බැංකුවල සංවිධානයේ මුදල් තැන්පත් කළ හැකිය.
ii)චෙක්පත් ඃ සංවිධානයේ නමින් ක්‍රියාත්මක කෙරෙන ජංගම ගිණුමක/ගිණුම්වලින් මුදල් ලබාගැනීමට නිකුත් කෙරෙන චෙක්පත් සඳහාත් තැන්පතු ගිණුමක/ගිණුම්වලින් මුදල් ආපසු ගැනීමට සංවිධානයේ පහතින් සඳහන් නිලධාරින්ගෙන් ඕනෑම දෙදෙනෙකුගේ අත්සන් තැබිය යුතුය.
කැඳවුම්කරු
භාණ්ඩාගාරික
ලේකම්
iii)බැංකු ප්‍රකාශ ඃ සංවිධානයේ භාණ්ඩාගාරික සහ භාරකාරත්ව මණ්ඩලයේ සාමාජිකයින් තිදෙනා විසින් ජංගම ගිණුම්වලට අදාල මාසික බැංකු ප්‍රකාශ ලබාගත යුතුය.

**13) මතභේද හා විනය**

i)අනු කමිටුඃ සංවිධානයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ සාමාජිකයින් අතර ඇතිවිය හැකි ඕනෑම මත භේදයක් නිරාකරණය කිරීම ක්‍රියාකාරී කමිටුවට නොහැකි වන විට එය මතභේද හා විනය අනුකමිටුවට යොමු කළ යුතු අතර මෙම අනුකමිටුව විසින් ලබා දෙන නිර්දේශය(න්) ට එකී සාමාජිකත්වය යටත් වන්නේ ය.

ii)සංයුතිය ඃ මතභේද සහ විනය අනු කමිටුව පත් කිරීම අවශ්‍යතා මතුවන අවස්ථාවකදී කළ හැකි අතර වෙනත් අනුකමිටු පත් කිරීම ද අවශ්‍යතා අනුව ක්‍රියාකාරී කමිටුව මගින් කළ යුතු වන අතර ක්‍රියාකාරී කමිටු සාමාජිකයින් නොවන ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් තිදෙනෙකුගෙන් පත් කරනු ලබන්නේය.

**14)ඉල්ලා අස්වීම ඃ**

ලේකම් වෙත ලිඛිතව බාර දෙන දැනුම්දීමකින් ඕනෑම සාමාජිකයෙකුට සංවිධානයෙන් ඉල්ලා අස්විය හැක.

**15) අස්කිරීම ,නිශ්චිත කාලයක් සඳහා සාමාජිකත්වය තහනම් කිරීම සහ යම් කිසි කාලයකට තනතුරු දැරීම තහනම් කිරීම ඃ**

i)කිසියම් සාමාජිකයෙකු සංවිධානයේ අරමුණුවලට හානිකර හෝ පටහැනි අයුරින් කටයුතු කරන්නේ යැයි හෝ සංවිධානයේ ගරුත්වයට හානි කර අයුරින් කටයුතු කරන්නේ යැයි හෝ එහි පැවැත්මට හානි කර අයුරින් කටයුතු කරන්නේ යැයි හෝ සංවිධානයේ අරමුණුවලට පටහැනි හෝ විරුද්ධ සංවිධානයක සාමාජිකත්වය දරන්නේ යැයි හෝ ක්‍රියාකාරී කමිටුව ඒත්තු යන්නේ නම් එම සාමාජිකයා හෝ සාමාජිකයින් සංවිධානයෙන් අස් කිරීමට, නිශ්චිත කාලයක් සඳහා සාමාජිකත්වය තහනම් කිරීමට සහ යම් කිසි කාලයකට තනතුරු දැරීම තහනම් කිරීමට ක්‍රියාකාරී කමිටුවට අයිතියක් ඇත.

ii) එවැනි අස්කිරීමක් හෝ තහනමක් පැනවීම කළ යුතු වන්නේ ක්‍රියාකාරී කමිටුව අදාල සාමාජිකයාට සවන්දීමෙන් අනතුරුවය. අදාළ ක්‍රියාමාර්ගයට එළඹීම සඳහා ක්‍රියාකාරී කමිටුවේ බහුතර කැමැත්ත අවශ්‍ය වේ.

iii)නිසි දැනුම්දීමකින් පසු අදාල සාමාජිකයා / සාමාජිකාව ක්‍රියාකාරී කමිටුව හමුවට දෙවරක්ම නොපැමිණියහොත් ක්‍රියාකාරී කමිටුවට තනි තීරණයක් ගත හැකිය

iv)ක්‍රියාකාරී කමිටු තීන්දුව හා එකග නොවන්නේ නම් එම සාමාජිකයාට තම නොගැලපීම මතභේද හා විනය අනු කමිටුවට යොමුකළ හැකි අතර ඉන් ලැබෙන තීන්දුව ඒ සම්බන්ධ අවසාන හා එකම තීන්දුව වනු ඇත

**16)සාමාජික මුදල ඃ**

i)භාරකාරත්ව මණ්ඩලය හා එකගත්වයෙන් ක්‍රියාකාරී කමිටුව විසින් තීන්දු කරනු ලබන ඇතුලත්වීමේ හා වාර්ෂික සාමාජික ගාස්තුවක් සෑම සාමාජිකයෙකුම ගෙවිය යුතුය

ii)වර්ෂයේ සම්පූර්ණ සාමාජික මුදලහෝ එහි වාරිකයක් ගෙවිය හැකි අතර, එම වසරේ මාර්තු 31 වන දින වන විට සම්පූර්ණයෙන්ම සාමාජික මුදල ගෙවා තිබිය යුතුය.

iii)මාර්තු 31 වන දිනට පසුව බැඳෙන සාමාජිකයින් සම්බන්ධ වන දිනයේ දී සාමාජික ගාස්තුව සහ ඇතුලත්වීමේ ගාස්තුව යන දෙකම ගෙවිය යුතු ය.

iv) සාමාජික මුදල් ගෙවිය යුතු පළමු වර්ෂය වනුයේ 1993 වර්ෂයය.

v)සංවිධානය ගොඩනැගීමේ දී පෞද්ගලික සහ සාමූහිකව දරණ ලද වියදම හේතුවෙන් ආරම්භක සාමාජිකයින්ගෙන් ඇතුලත් වීමේ ගාස්තුවක් අය කරනු නොලැබේ.

vi)සාමාජික මුදල හිග ඇති සාමාජිකයින්ට වාර්ෂික හෝ විශේෂ සම්මේලනයන්ට සහභාගිවන්නට හෝ ඡන්දය ලබා දීමට නොහැකි අතර නිල තනතුරු සඳහා සාමාජිකයින්

යෝජනා ඉදිරිපත් කිරීමටත් ස්ථිර කිරීමටත් නොහැකිය

vii)වසරකට වැඩි කාලයක් සාමාජික මුදල හිග සාමාජිකයෙකු ඒ අර්ථයෙන්ම සංවිධානයේ සාමාජිකත්වය අහෝසි වූවෙකු වන්නේය.

**16 (අ) මූල්‍ය වර්ෂයː**
සංවිධානයේ මූල්‍ය වර්ෂය ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වී, දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වෙයි.

**17) දැන්වීම්**
(i)සියලුම සාමාජිකයින්ගේ ලිපිනයන් වෙත සාමාන්‍ය තැපෑලෙන් යවනු ලබන දැන්වීම දැනුම්දීමක් ලෙස සලකනු ලබන අතර එය සංවිධානයේ ලියුම් රේජිස්ටරයේ සඳහන් විය යුතුය.
ii) දැන්වීම් යැවිය යුතු ලිපිනයෙහි වෙනසක් සිදු වී නම් එය ලේකම් වෙත දැනුම් දීම සාමාජිකයින්ගේ වගකීමකි.

**18)සංවිධානයේ ලිපිනයː**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ මේ මොහොතේ ලිපිනය 237/22, විජය කුමාරතුංග මාවත, කොළඹ 05 වේ. මෙම ලිපිනය ක්‍රියාකාරී කමිටුව විසින් භාරකාර මණ්ඩලයේ කැමැත්ත මත වෙනස් කරනු ලැබිය හැකිය.

**19)නියෝජනය ඃ**
ක්‍රියාකාරී කමිටුවේ එකගත්වයකින් තොරව කිසිදු සාමාජිකයෙකු නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නියෝජනය කරමින් ප්‍රසිද්ධ උත්සවයකට / රැස්වීමකට / ඉසව්වකට සහභාගි නොවිය යුතුවා සේම ප්‍රකාශ නොකළ යුතුය ඒ වගේම ලිපි හෝ රචනා පළ කිරීම සාකච්ඡා ලබා දීම හෝ නිවේදන නිකුත් කිරීම ද නොකළ යුතුය.

**20)මෙහි ආවරණය නොවුණු කරුණු ඃ**
අවශ්‍ය යැයි හැගෙන්නේ නම් මෙම ව්‍යවස්ථාවෙන් ආවරණය නොවුණු ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් ඉක්මන් පියවර අවශ්‍ය වන විට හා එසේ විය යුතු යැයි ඒත්තු යන්නේ නම් තීරණ ගැනීමේ බලය ක්‍රියාකාරි කමිටුව සතුය.

**21) සාමාජිකත්වය අර්ථ නිරූපණය කිරීමː**

මෙම ව්‍යවස්ථාවෙහි වෙනත් අයුරකින් සඳහන් නොවන්නේ නම්, 'සාමාජිකයා හෝ 'සාමාජිකයින්'යන්නට ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සහ/හෝ ආරාධිත සාමාජිකයින් ඇතුළත් වන්නේ ය.
පැමිණ සිටි සාමාජිකයින්ගේ ඒකමතික කැමැත්තෙන්, 1992, නොවැම්බර් මස 8 වන දින අනුරාධපුරයේ දී පැවති පළමු මහ සභා රැස්වීමේ දී පහත දැක්වෙන භාරකාර මණ්ඩලය, නිලධාරී මඩුල්ල සහ කමිටු සාමාජිකයින් ක්‍රියාකාරී කමිටුව සඳහා ඡන්දයෙන් පත් කර ගන්නා ලදී.

කැඳවුම්කරු : ආරියනන්ද දොඹගහවත්ත මහතා
මහ ලේකම් : සමන් වගආරච්චි මහතා
භාණ්ඩාගාරිකඃ බන්දුල පද්මකුමාර මහතා
උප ලේකම් : චන්දන කීර්ති බණ්ඩාර මහතා
කමිටු සාමාජිකයින්ඃ ලූෂන් රාජකරුණානායක, වරුණ කරුණාතිලක, නිව්ටන් සෙනෙවිරත්න යන මහත්වරුන්

භාරකරුවන්ඃ
පහත සාමාජිකයින් භාරකාර මණ්ඩලය සඳහා පත් කර ගන්නා ලදී.
සුනන්ද දේශප්‍රිය මහතා
අජිත් සමරනායක මහතා

කැඳවුම්කරු　　　　　　මහ ලේකම්　　　　　　භාරකරු